වාරිමාර්ග දෙපාර්තමේන්තුව
நீர்ப்பாசனத் திணைக்களம்
**IRRIGATION DEPARTMENT**
**(HYDROLOGY DIVISION)**

වාරිමාර්ග අධ්‍යක්ෂ / நீர்ப்பாசனத் பணிப்பாளர் / Director of Irrigation } 011-2581636
ෆැක්ස් / பக்ஸ் / Fax } 011-2591125
ලිපිනය / முகவரி / Address } 230, තැ.පෙ. 1138, බෞද්ධාලෝක මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව
230, த.பெ.1138, பௌத்தாலோக மாவத்தை, கொழும்பு 07, இலங்கை
230, P.O. Box 1138, BauddhalokaMawatha, Colombo 07, Sri Lanka

දුරකථනය(පොදු) / தொலைபேசி(பொது) / Telephone(General) } 011-2590145
විද්‍යුත් ලිපිනය / ஈ.மெயில் முகவரி / E-mail Address } directorhyg@gmail.com
වෙබ් අඩවිය / இணையத்தளம் / Web site } www.irrigation.gov.lk


මගේ අංකය / எனது இல / My No. } HYG/W/103
ඔබේ අංකය / உமது இல / Your No. }
දිනය / திகதி / Date } 2019/ 09/18

ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන අංක - 04

2019.09. 18 දින පස්වරු 4.00 නිකුත් කරන ලදී.

අධ්‍යක්ෂ ජනරාල්,
ආපදා කළමණාකරන මධ්‍යස්ථානය.

## <u>ප්‍රධාන ගංගාවල ගංවතුර තත්වය පහව යයි.</u>

ප්‍රධාන ගංගා ආශ්‍රිතව 2019.09.16 වන දින සිට පැවති ගංවතුර තත්වය මේ වන විට පහව ගොස් ඇති අතර සියළුම ගංගා සාමාන්‍ය තත්වයට පත්වෙමින් පවතී. එසේ වුවත් කළු ගඟ ධාරා ප්‍රදේශයේ මිල්ලකන්ද ජල මට්ටම් තවදුරටත් අවධානය යොමුවියයුතු මට්ටමක පවතින අතර එම ජල මට්ටම් ක්‍රමයෙන් සාමාන්‍ය තත්වයට පත්වෙමින් පවතී.

එසේම ඉහත සඳහන් කිසිදුධාරා ප්‍රදේශයකට පසුගිය පැය 24 තුල සැලකියයුතු මට්ටමේ වර්ෂාපතනයක් නොලැබුණ බැවින් එම ගංගාවල ජල මට්ටම් තවදුරටත් ඉහල යාමක් අපේක්ෂා නොකෙරේ.

අද පස්වරු 3.00 වන විට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ජල විද්‍යා අංශයවිසින් පවත්වාගෙන යනු ලබන මිල්ලකන්ද ජල මිනුම් ස්ථානයේ ජල මට්ටම් පහත පරිදිවේ.

| අංකය | ගංගාවල/අතු ගංගාව | ජලමිණුම් ස්ථානය | දැන් පවතින ජල මට්ටම | ඒකකය | විමසිලිමත් වියයුතු මට්ටම | සුළු ගංවතුර මට්ටම |
|---|---|---|---|---|---|---|
| 01. | කළු ගඟ | මිල්ලකන්ද | 6.65 | මීටර් | 5.0 | 6.5 |

ඉහත දත්ත අනුව කළු ගඟේ ජල මට්ටම්ද සාමාන්‍ය තත්වයට පත්වෙමින් පවතින බැවින් මෙම දෙපාර්තමේන්තුවේ ජලවිද්‍යා අංශය විසින් පවත්වාගෙන ආ හදිසි රාත්‍රී ගංවතුර මෙහෙයුම් කටයුතු අද දින පස්වරු 4.30 සිට තාවකාලිකව අත්හිටවනු ලැබේ. එසේ නමුත් දිවයිනේ සියළුම ගංගාවල ජල මට්ටම් නිරීක්ෂණය සම්බන්ධයෙන් මෙම අංශය විසින් කරගෙන යන කටයුතු අඛණ්ඩව සිදු කරගෙන යන බව කාරුණිකව දන්වනු ලබන අතර ගංගාවල ජල මට්ටම් නැවත ඉහල යාමක් සිදු වුවහොත් ඒ පිළිබඳව සුදුදු පරිදි දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

ඉංජි.ආර්.එම්.එම්.ආර්.අලවතුගොඩ
වාරිමාර්ග අධ්‍යක්ෂ (ජලවිද්‍යා)

Eng. R. M. M. R. Alawathugoda
Director of Irrigation(Hydrology)
Hydrology Division
Irrigation Department
Colombo 07

**පිටපත්:-**
01. වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්
02. අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් (වි.ක්‍රු.සැ හා සැ)
03. ජන මාධ්‍ය

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date : 2019/09/18
Time : 1645 hrs
DISASTER MANAGEMENT CENTRE